# ජපුර විද්‍යාර්ථීන්ගේ වාර්ෂික සුහද හමුව.

**මාර්තු 17 වන දා රාත්‍රි 7 ට ස්කෝස්බි 1330 ශාලාවේදී ලංකාවේ සුප්‍රකට වේග රිද්ම ගායන ශිල්පි ඩෙස්මන් සිල්වා සමග සොලිඩ් ශ්‍රී සංගීත කණ්ඩායම සංගීතයෙන්**

මේ සුහද හමුව ගැන අපි ජයවර්ධනපුර විද්‍යාර්ථීන්ගේ සංගමයේ සභාපති ප්‍රභාශ් ගලගෙදර මහතා සමග සාකච්ඡා කළෙමු.

**සන්නස**
ඔබේ සංගමය ගැන හැඳින්වීමක් කළොත්?

**ප්‍රභාශ්**
මේ සංගමය ආරම්භ කරලා දැනට අවුරුදු 3 ක් පමණ වෙනවා. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලද අය විශාල සංඛ්‍යාවක් මෙහි වෙසෙනවා. මේ අයට එක්වන්නට අවකාශයක් සදන්නටත් ඒ හරහා යම් සේවයක් කරන්නටත් අපේ සංගමය ආරම්භ කළා. දැනට අපේ සංගමයේ සාමාජිකයන් 300 ක් පමණ සිටිනවා.



සංගමයේ ආරම්භක සභාපතිවරයා වුණේ ජයමිණි කාරියවසම්. දෙවෙනි වසරේ සභාපති වුණේ මිලෝන් ලැන්ඩර්ස්. මේ අයත් මේ සංගමය ආරම්භ කරන්නට මහත් වෙහෙසක් ගත් අපේ සියලු සොයුරු සොයුරියනුත් කෘතවේදීව සිහිපත් කරන්න මම කැමතියි.

**සන්නස**
ඔබේ සංගමයේ අමුණු පිළිබඳව වැඩි විස්තරයක් කරන්න පුලුවන්ද?
**ප්‍රභාශ්**
අපේ අරමුණු කීපයක්ම තියෙනවා. සාමාජිකයන් සඳහා රැකියා ප්‍රවර්ධන වැඩමුළු සංවිධානය කිරීම එයින් එකක්. විසිරී සිටින සාමාජිකයන් එක් රැස්කර ඔවුනට අත්දැකීම් බෙදා හදා ගන්නට ඉඩ කඩ සැළසීමත් අපේ සංගමයෙන් සිදුවෙනවා. අපි ශිෂ්‍යත්ව වැඩ සටහනකුත් ක්‍රියාත්මක කරනවා. දැනට ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් 17 දෙනෙකුට අපි ශිෂ්‍යත්ව ප්‍රදානය කර තිබෙනවා. ඒ වෙනුවෙන් අපි දැනට ඩොලර් 50000 ක මුදලක් එක්රැස් කර තිබෙනවා. ඒ මුදල ශ්‍රී ලංකාවේ බැංකුවක තැන්පත් කර එයින් ලැබෙන ආදායමින් තමයි මේ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන්නෙ. අපි වෙසෙන ඔස්ට්‍රේලියානු සමාජයට යම් සේවයක් කිරීමත් අපේ අරමුණක්.

**සන්නස**
කොහොමද මේ තරම් විශාල අරමුදලක් සොයා ගත්තෙ?
**ප්‍රභාශ්**
අපේ සාමාජිකයන්ගේ සහයෝගයෙන්ම තමයි. අපි එක් එක් කණ්ඩායම් වලින් සහ පුද්ගලිකව ඩොලර් 2500 බැගින් එකතු කරදීමෙන් තමයි මුලු මුදල එකතු කරගත්තෙ.

**සන්නස**
ගිය වසරේ ඔබ සංගමය මොන වගේ ක්‍රියාකාරකම් වලද නියැලුණේ?

**ප්‍රභාශ්**
අපි ක්ලින් ඕස්ට්‍රේලියා ඇතුළු මෙහි ඇති විවිධ සමාජ ක්‍රියාකාරකම් වලට කණ්ඩායමක් ලෙස සහභාගි වුණා. විවිධ ප්‍රවර්ධන වැඩ සටහන් කළා. අපේ විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථියකු වන මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා ගෙන්වා හිල්ටන් හෝටලයේදී සම්මන්ත්‍රණයක් පවත්වන්නටත් අපට හැකි වුණා. මේ වසරේදීත් එවැනි සම්මන්ත්‍රණයක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි ආරාධනා කර සිටිනවා දැනටමත් අප සමග එක් වෙලා නැති ජපුර විද්‍යාර්ථීන් සිටිනවා නම් ඔවුන්ටත් අපට එක්වන ලෙස. ඒ සඳහා www.japuraalumni.com. වෙබ් අඩවිය හරහා පහසුකම් සපයා තිබෙනවා. එසේත් නැත්නම් දුරකතනයෙන් අනුර 0431 112 923 දේවන් 0431 818 685 සහ ප්‍රභාශ් 0400 250 450 අමතන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ එක්කම ඩෙස්මන් සිල්වා ශිල්පියා සමගින් සුන්දර සැන්දෑවක් ගත කරන්නට "ජපුර ෆැමිලි නයිට් විත් ඩෙස්මන්ඩ්" වාර්ශික සාදයට එක්වන ලෙස අපි සියලු සාමාජික සාමාජිකාවන්ගනේ ඉල්ලා සිටිනවා. මේ සැන්දෑවට ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා තානාපති රියල් අද්මිරාල් තිසර සමරසිංහ මහතාත් මෙල්බන්හි ශ්‍රී ලංකා කොන්සල් බන්දු දිසානායක මහතාත් සහභාගි වෙනවා.

සාකච්ඡා කළේ
**ශ්‍රීනාත් මද්දුමගේ**





## VCE English

**Chemistry, Biology**
**& Physics**
**Maths Methods, Further & Specialist Maths**
**English (Year 6 to 12)**
**Maths (Year 6 to 12)**

Biochemistry & Chemistry
All Undergraduate & Post Graduate Levels

Specialised Coaching for entrance tests/exams of
Popular schools

**Family & Multiple subject Discounts**

We Follow **VCAA** guidelines, **VELS & PoLT**

Fully Registered Teachers

**For further information call Sandya: 0402 503 398**

Bundoora Coaching College
University Hill
Bundoora

www.bundooracoachingcollege.com.au